**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2022 නොවැම්බර් මස 16 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා, විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1, 2 සහ 4 චූදිතයන් වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>3 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී.<br><br>5 සහ 6 වන චූදිතයන් වෙනුවෙන් අද්නාන් ෆසාල් මහතාගේ උපදෙස් මත ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී. | |

| | | |
|---|---|---|
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, බන්ධනාගාර විශේෂ කාර්ය බලකාය (මහාධිකරණ ශාලාවෙන් පිටත සිටියේය.), බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥතුමිය මෙම නඩුව සඳහා 2023 වර්ෂයේ ජනවාරි මස 24 වන දින කැඳවීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි අංක 23, 16, 63 සඳහා ද, 2023 වර්ෂයේ ජනවාරි මස 25 වන දින කැඳවීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි අංක 40 හා 43 සඳහාද සිතාසි අයැද සිටින ලදී.

මෙදින 3 වන සහ 4 වන විත්තිකරුවන් සම්බන්ධයෙන් ඇප නියෝගය ලබා දෙන ලදී. ඒ අනුව එම විත්තිකරුවන් දෙදෙනා සඳහා ඇප ලබා නොදීමට නියෝග කරන ලදී. මෙහිදී 3 වන චූදිතට මෙම නඩුවට අමතරව චෝදනා ඇති බවටත්, පොලිස් නිලධාරීන් මරා දැමීම සම්බන්ධයෙන් අධිචෝදනා ඇති බවටත්, යොමු කර ඇති වෛද්‍ය වාර්තාව අනුව 3 වන චූදිතට දැනට ලෙඩක් ඇති බව නොපෙනෙන බවටත්, වසර 3ක් රක්ෂිත බන්ධනාගාරගතව සිටීම ප්‍රමාණවත් විශේෂ කරුණක් නොවන බවටත්, 2022 අංක 12 දරණ සංශෝධනයෙන් සංශෝධිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ගොණු කර ඇති බැවින් ඇප ලබා දීම සඳහා කිසිදු විශේෂ කරුණක් නැති බවටත් ආදී කරුණු දක්වමින් 3 වන චූදිතට ඇප ලබාදීම ප්‍රතික්ෂේප කරමින් නියෝගය ප්‍රකාශ කරන ලදී. මෙහිදී 4 වන චූදිත කෑගල්ල මහාධිකරණයේ HC 44/21 දරණ නඩුවේ වරද පිළිගෙන ඇති බැවින් ද, 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරයේ තැන් 8ක බෝම්බ පිපුරුවීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් HC TAB 2972/21 නඩුවේ අධිචෝදනා ලබා ඇති බැවින් ද, බිරිඳ ද බන්ධනාගාරගතව ඇත යන කරුණ මත පමණක් ඇප ලබාදිය නොහැකි බැවින්ද 2022 අංක 12 දරණ සංශෝධනයෙන් සංශෝධිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ගොණු කර ඇති බැවින් ඇප ලබා දීම සඳහා කිසිදු විශේෂ කරුණක් නැති බවටත් ආදී කරුණු දක්වමින් 4 වන චූදිතට ඇප ලබාදීම ප්‍රතික්ෂේප කරමින් නියෝගය ප්‍රකාශ කරන ලදී.

නීතිඥ මහතුන්ගේ ඉල්ලීම පරිදි 4 හා 6 යන විත්තිකරුවන්ව (බූස්ස බන්ධනාගාරය හා සබැඳිව) නීතිඥවරුන්ට හමුවීමට පැය භාගයකට (විනාඩි 30කට) අධික කාලයක් ලබා දීමට විනිසුරුවුරුන් නියෝග කරන ලදී. එමෙන්ම 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතාගේ ඉල්ලීම පරිදි එම විත්තිකරුව නැවත

බන්ධනාගාරයට ගෙන යාමට පෙර එම අදාළ නීතිඥ මහතාට විත්තිකරු සමඟින් කතා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙසද විනිසුරුවරුන් දන්වා සිටින ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 ජනවාරි මස 24, 25 සහ 26 යන දිනයන්

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

- https://m.facebook.com/story.php?story_fbid=pfbid025EE7phyVqREXJdNAbG9Fv41dhE4YUzyVfPLkgbfSHyxs1MeeU4GsftJbR8SPEp5Tl&id=100084454436600&mibextid=Nif5oz